තොරතුරු මාසිකය

# විමර්ශන

2024 මාර්තු
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# රට හැර යාම ආර්ථික අර්බුදයේ පැතිකඩක් ලෙස

**ලංකාවේ අප ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මුහුණ දී ඇති තවත් අර්බුදයක් වන්නේ මිනිසුන් රට හැර යාමයි. එය රැකියා සඳහා පිටත්ව යාම, ස්ථිර පදිංචිය සඳහා පිටත්ව යාම, අධ්‍යාපනය සඳහා පිටත්ව යාම ලෙස ප්‍රධාන වශයෙන් වර්ග කළ හැකිය. මේ කුමන ආකාරයට ගියද, එය ආර්ථික අර්බුදයේම කොටසකි. දරුවන්ට අධ්‍යාපනය දීමට නොහැකි වීමත්, ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා නිර්මාණය කර දීමට නොහැකි වීමත්, මිනිසුන්ට ජීවත් වීමට හැකි රටක් නිර්මාණය කර ගැනීමට නොහැකි වීමත් අර්බුදයේම කොටස්ය. මහ බැංකුවේ සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරුවලට අනුව මෙය තව දුරටත් පැහැදිලි කර ගත හැකිය.**

| රැකියා සඳහා රටින් පිටව ගිය පුද්ගලයන් සංඛ්‍යාව | |
|---|---|
| 2019 | 2,03,087 |
| 2020 | 53,711 |
| 2021 | 1,22,264 |
| 2022 | 3,11,269 |
| 2023 | 2,24,133 (සැප් දක්වා) |

ඉහත සංඛ්‍යාවන්ට අනුව 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ 154%කින් විදෙස් රටවලට සේවා සඳහා යාම ඉහළ ගොස් ඇති අතර, 2023 වසර අවසාන වනවිට 3,00,000 පමණ රැකියා සොයා පිටරට ගොස් ඇත. මෙලෙස රැකියා සඳහා පිටත්ව ගිය පිරිසෙන් වැඩිම පිරිසක් අයත් වන්නේ පිළිවෙළින් මඩකළපුව, අම්පාර, නුවර යන දිස්ත්‍රික්කවලටය. පිටරට රැකියා සොයා ගිය අයට කුමන කලාපවල රැකියා අවස්ථා ලැබී ඇත්දැයි පහත වගුවෙන් දැක්වේ.

ඉහත දත්තවලට අනුව අපගේ රැකියා වෙළෙඳපොළ මුළුමනින්ම ඉලක්ක වී ඇත්තේ, මැදපෙරදිගට බව ඉතා පැහැදිලිය. එහි වැඩිම රැකියා අවස්ථා ලැබී ඇත්තේ, පිළිවෙළින් කුවේටය, කටාර් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආදියෙනි. ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල රැකියා අවස්ථා උදා වී ඇත්තේ, ඉතා සුළු වශයෙනි. ඒ අනුව අපගේ රැකියා අවස්ථා බොහෝවිට

| රැකියා ලද කලාපයන් | | |
|---|---|---|
| රට | 2022 | 2023 (සැප් දක්වා) |
| මැද පෙරදිග | 84.7% | 77.4 % |
| ආසියාව | 6.3% | 7.9 % |
| යුරෝපා සංගමය | 4.0% | 7.4 % |
| ඕස්ට්‍රේලියාව නවසීලන්තය | 0.2% | 0.9 % |
| දකුණු ආසියාව | 3.4% | 4.1 % |
| අනෙකුත් රටවල් | 1.4% | 2.3 % |

අවස්ථා නොලැබෙන්නේ ඇයිදැයි විමසා බැලිය යුතුය.

අනෙක් අතට මෙලෙස කම්කරු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියා සඳහා පිටව යන පිරිසෙන් තරුණ කොටස්ද සිටීම ඉතා ඛේදනීය තත්ත්වයකි. පහතින් දැක්වෙන්නේ 2022 වසරේ රැකියා සඳහා පිටත්ව ගිය පිරිසෙන් තරුණ වයසේ කොටසය. එය 42%ක පමණ ප්‍රමාණයකි. අනෙක් අතට මුළු ශ්‍රමික පිරිසෙන් කාන්තා ශ්‍රමික ප්‍රතිශතය 2022

| තරුණ වයසේ ශ්‍රමිකයන්ගේ පිටත්ව යාම 2022 වසර | | |
|---|---|---|
| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා |
| 20-24 | 22,257 | 6,039 |
| 25-29 | 37,215 | 13,694 |
| 30-34 | 34,718 | 16,766 |
| එකතුව | 94,190 | 36,494 |

වසරේ 40%ක් පමණ වන අතර ,එය 2023 වසරේ 44%ක් පමණ වේ යැයි ගණන් බලා තිබේ.

මෙලෙස රැකියාවල නිරත වී වසර කිහිපයක ලැබූ විදේශ ප්‍රේෂණ ප්‍රමාණ පහතින් දැක්වේ.

| විදෙස් ප්‍රේෂණ (ඇ. ජ. ඩො. මිලියන) | |
|---|---|
| 2019 | 6,717 |
| 2020 | 7,103 |
| 2021 | 5,492 |
| 2022 | 3,788 |
| 2023 | 5,970 |

| ශ්‍රේණීන් අනුව රැකියා වර්ගීකරණය | | |
|---|---|---|
| | 2022 | 2023 (සැප් දක්වා) |
| කම්කරු | 33.9% | 30.7% |
| අර්ධ පුහුණු | 25.2% | 28.3% |
| පුහුණු | 29.8% | 28.5% |
| මධ්‍යම මට්ටමේ | 2.6% | 3.4% |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | 3.9% | 3.9% |
| වෘත්තීය | 4.6% | 5.1% |

කම්කරු සහ නුපුහුණු රැකියා සඳහා යොමු වී ඇත.

ඉහත වර්ගීකරණය අනුව 60%ක් පමණ කොටසකට ලැබී ඇත්තේ, කම්කරු සහ අර්ධ පුහුණු රැකියා අවස්ථාය. ඉහත සඳහන් කළ කලාප වර්ගීකරණය අනුව මැදපෙරදිග කලාපයේ කම්කරු රැකියා හරහා අපගේ වැඩිම විදේශ විනිමය ආදායම ලැබෙමින් තිබීම සතුටු විය හැකි කරුණක් නොවේ. ඉතා ඉහළ සාක්ෂරතාවක් ඇති ලංකාව වැනි රටකට වෘත්තීය රැකියා

මෑත කාලයේ වැඩිම විදෙස් ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇත්තේ, 2020 වසරේය. එහෙත්, 2023 වසරේ අප රටට ලැබී ඇත්තේ, ඩොලර් මිලියන 5,970කි. මෙය ඉතා විශාල ඉහළ යාමක් ලෙස රජය හුවාදැක්වීමට උත්සාහ කළද, 2021, 2022 සහ 2023 වසරවල රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව ගැන සලකා බලන කල මෙය ඉතා අඩු අගයකි. 2020ට පසු එම වසර තුනෙහි ලක්ෂ හතකට වැඩි පිරිසක් රැකියා සඳහා ගොස් ඇත් නම්, මේ වසරේ ප්‍රේෂණවලට එම පිරිස එවන මුදල් එකතු විය යුතුය. ඒ අනුව මෙය සාමාන්‍ය තත්ත්වයට ළඟා වීමට නම්, 2023 වසරේ අවම වශයෙන් ඩොලර් මිලියන 8,000 සීමාවවත් පසු කළ යුතුව තිබිණි.

# රාජ්‍ය ආයතන විකිණීම

කිසියම් රටක් තම අනන්‍යතාවන්ට, ශක්‍යතාවන්ට අනුරූපව පාලනයන්,පාලකයන්වෙනස්වුව ද,රටේඅනාගතයඅභිමුඛකරගනිමින් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. ඒ අනුව 1977න් පසු අප රටේ පැවැති සෑම පාලනයක්ම නොවෙනස්ව අනුගමනය කරන ආර්ථික උපායමාර්ගයක් වේ. ඒ නව ලිබරල් ආර්ථික ක්‍රමයයි. එහි ලා වන රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය අඛණ්ඩව සිදුකරන ආකාරය හඳුනාගත හැකිය. 1990 වසරේ සිට ආසන්න 2023 වසර දක්වා පෞද්ගලිකකරණයේ දිගහැරුම පහතින් දක්වා ඇත.

## ශ්‍රී ලංකාවේ පෞද්ගලිකකරණයේ ශේෂ පත්‍රය

| | කර්මාන්තය - ආයතනය | වසර සහ මාසය | ප්‍රතිශතය | මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 01. | තුල්හිරිය ටෙක්ස්ටයිල්ස් | 1990 පෙබරවාරි | 100% | 200.0 |
| 02. | පුගොඩ ටෙක්ස්ටයිල්ස් | 1990 ජුනි | 100% | 60.0 |
| 03. | සිලෝන් ඔක්සිජන් | 1990 නොවැම්බර් | 100% | 27.6 |
| 04. | දන්කොටුව පෝසිලේන් | 1990 දෙසැම්බර් | 50% | 102.0 |
| 05. | සිලෝන් ලෙදර් ප්‍රඩක්ට්ස් | 1991 ජූලි | 100% | 40.0 |
| 06. | ලංකා මිල්ක් ෆුඩ්ස් (ලක්ස්ප්‍රේ) | 1991 ඔක්තෝබර් | 100% | 843.3 |
| 07. | ශ්‍රී ලංකා ටයර් සංස්ථාව | 1991 දෙසැම්බර් | 100% | 589.2 |
| 08. | ඩිස්ටිලරිස් කම්පැනි (DCSL) | 1992 පෙබරවාරි | 100% | 1,378.6 |
| 09. | නයිලෝන් 6 තෙල් සංස්ථාව | 1992 පෙබරවාරි | 100% | 227.7 |
| 10. | මත්තේගම පෙහෙකම්හල | 1991 දෙසැම්බර් | 100% | 9.2 |
| 11. | තෙල් සහ මේද සංස්ථාව | 1991 අගෝස්තු | 60% | 16.8 |
| 12. | ලංකා ලෝහ සංස්ථාව | 1991 ඔක්තෝබර් | 100% | 30.0 |
| 13. | වේයන්ගොඩ ටෙක්ස්ටයිල්ස් | 1992 මාර්තු | 100% | 405.0 |
| 14. | මහවැලි මෙරයින් සමාගම | 1992 ජූලි | 100% | 82.76 |
| 15. | ලංකා සෙරමික් | 1992 ජූලි | 100% | 1,387.1 |
| 16. | රුහුණු සිමෙන්ති සමාගම | 1994 ජනවාරි | 85% | 237.6 |
| 17. | බෝගල මිනිරන් සමාගම | 1993 පෙබරවාරි | 100% | 265.6 |
| 18. | හිඟුරාන සීනි සමාගම | 1993 මාර්තු | 100% | 25.0 |
| 19. | කහටගහ පතල මිනිරන් සමාගම | 1993 සැප්තැම්බර් | 100% | 16.5 |
| 20. | ලංකා පෝසිලේන් | 1992 සැප්තැම්බර් | 100% | 95.4 |
| 21. | සී.සී.සී. ඉංජිනියරින් සමාගම | 1990 දෙසැම්බර් | 100% | 102.0 |
| 22. | ජාතික කඩදාසි සංස්ථාව | 2005 සැප්තැම්බර් | 100% | 405.0 |
| 23. | ලංකා කැනරීස් | 1993 නොවැම්බර් | 60% | 102.5 |
| 24. | පුත්තලම සිමෙන්ති කම්හල | 1993 දෙසැම්බර් | 100% | 914.6 |
| 25. | වයඹ ඇග්‍රෝ පොහොර සමාගම | 1994 මාර්තු | 100% | 29.3 |
| 26. | කුඩා තේවතු හිමියන්ගේ කර්මාන්ත | 1994 අප්‍රේල් | 100% | 76.4 |
| 27. | රුහුණු ඇග්‍රෝ පොහොර සමාගම | 1994 මැයි | 100% | 29.0 |
| 28. | සීමාසහිත කන්තලේ සමාගම | 1994 | - | - |
| 29. | සී.සී.සී. පොහොර සමාගම | 1994 ජූලි | 100% | 85.1 |

03 පිටුවට

| | | | | |
|---|---|---|---|---|
| 30. | ලංකා තනීලැලි ගිංතොට | 1994 මැයි | වත්කම් විකිණීම | 27.8 |
| 31. | ස්ටැට්කෝන් රබර් සමාගම | 1995 සැප්තැම්බර් | 55% | 17.8 |
| 32. | කොළඹ ගෑස් සමාගම | 1995 දෙසැම්බර් | 51% | 1,992.8 |
| 33. | රජරට ඇග්‍රෝ පොහොර සමාගම | 1996 ජූලි | 100% | 60.1 |
| 34. | ලංකා පොහොර සමාගම | 1992 ජනවාරි | 100% | 452.8 |
| 35. | පුත්තලම ලුණු සමාගම | 1991 පෙබරවාරි | 100% | 122.5 |
| 36. | සිලෝන් ග්ලාස් කොම්පැනි | | | 44.7 |

| | කර්මාන්තය - ආයතනය | වසර සහ මාසය | ප්‍රතිශතය | මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 37. | ත්‍රිකුණාමලය පිටි සමාගම | 2001 ජුනි | 100% | 5,870 |
| 38. | පැල්වත්ත සීනි සමාගම | 2002 මාර්තු | 53% | 295.7 |
| 39. | සෙවණගල සීනි සමාගම | 2002 ජුනි | 100% | 550.0 |
| 40. | ආහාර දෙපාර්තමේන්තුවේ මුළුතැන්ගෙය | 2003 නොවැම්බර් | 100% | 2.0 |
| 41. | ඉන්ටර්නැෂනල් ඩෙයරි ප්‍රඩක්ට්ස් | 2004 මාර්තු | 40% | 18.0 |
| | අනෙකුත් | | | |
| 01. | හිඟුරක්ගොඩ බීජ ගොවිපොළ (වත්කම්) | 1988 ජූලි | | 5.6 |
| 02. | පැල්වත්ත ගොවිපොළ (ඉඩම්) | 2000 ජනවාරි | | 1.5 |
| 03. | කන්තලේ සීනි (ඉඩම්) | 2000 ජනවාරි | | 4.1 |

| | වැවිලි සමාගම් | වසර සහ මාසය | ප්‍රතිශතය | මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 01. | බොගවන්තලාව වැවිලි සමාගම | 1995 සැප්තැම්බර් | 100% | 297.0 |
| 02. | කොටගල වැවිලි සමාගම | 1995 සැප්තැම්බර් | 81% | 139.0 |
| 03. | කෑගල්ල වැවිලි සමාගම | 1995 ඔක්තෝබර් | 100% | 257.3 |
| 04. | අගලවත්ත වැවිලි සමාගම | 1995 ඔක්තෝබර් | 100% | 271.5 |
| 05. | හොරණ වැවිලි සමාගම | 1995 නොවැම්බර් | 100% | 259.4 |
| 06. | කැලණිවැලි වැවිලි සමාගම | 1995 ජනවාරි | 100% | 261.3 |
| 07. | වටවල වැවිලි සමාගම | 1996 ජනවාරි | 100% | 593.4 |
| 08. | මස්කෙලිය වැවිලි සමාගම | 1996 ජනවාරි | 100% | 466.0 |
| 09. | මඩොල්සිම වැවිලි සමාගම | 1996 පෙබරවාරි | 81% | 153.0 |
| 10. | ආගරපතන වැවිලි සමාගම | 1996 සැප්තැම්බර් | 61% | 268.0 |
| 11. | හපුගස්තැන්න වැවිලි සමාගම | 1996 සැප්තැම්බර් | 89.2% | 328.0 |
| 12. | බලංගොඩ වැවිලි සමාගම | 1996 සැප්තැම්බර් | 100% | 646.5 |
| 13. | උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම | 1996 ඔක්තෝබර් | 90.2% | 349.2 |
| 14. | නමුණුකුළ වැවිලි සමාගම | 1997 ජූලි | 81% | 474.0 |
| 15. | මතුරට වැවිලි සමාගම | 1997 ජූලි | 61% | 466.5 |
| 16. | මල්වත්ත වැවිලි සමාගම | 1997 ජූලි | 100% | 703.4 |
| 17. | කහවත්ත වැවිලි සමාගම | 1997 ජූලි | 88.6 | 366.7 |
| 18. | ඇල්පිටිය වැවිලි සමාගම | 1997 ජූලි | 61% | 308.0 |
| 19. | තලවකැලේ වැවිලි සමාගම | 1998 ජනවාරි | 100% | 476.5 |
| 20. | පුස්සැල්ලාව වැවිලි සමාගම | 1998 ජනවාරි | 61% | 397.8 |

| | මූල්‍ය ආයතන | වසර සහ මාසය | ප්‍රතිශතය | මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 01. | සී.ස. ජාතික සංවර්ධන බැංකුව | 1993 මාර්තු | 57.8% | 5,531.8 |
| 02. | සී.ස. ඇක්ලන්ඩ් රක්ෂණ සංස්ථාව | 1993 මැයි | | 13.8 |
| 03. | සී.ස. පීපල්ස් මර්චන්ට් බැංකුව | 1993 ජුනි | 61% | 155.0 |
| 04. | ප්‍රාග්ධන සංවර්ධන ආයෝජන සමාගම | 1995 නොවැම්බර් | 39% | 371.2 |

07 පිටුවට

# මානව පරිණාමය පිළිබඳ නූතන

**පසුගිය කලාපය හා සම්බන්ධයි.**

## හෝමෝ ඇන්ටිසෙසර් (Homo Antecessor)

ලතින් භාෂාවෙන් 'පුරෝගාමියා', 'මුල් පදිංචිකරුවා' ආදී අරුත් දෙන ඇන්ටිසෙසර් යන නාමයෙන් 1997දී නම් කරන ලද මානව විශේෂයට අයත් පොසිල ප්‍රථම වරට සොයාගෙන තිබුණේ ස්පාඤ්ඤයේ ග්‍රැන් ඩොලීනා ගුහාව ආශ්‍රිතවය. ඒ 1994දීය. සේපියන් සහ නියැන්ඩර්තාල් මානවයන් විශේෂ දෙකක් ලෙස වෙන්ව පරිණාමය වූයේ හෝමෝ ඇන්ටිසෙසර්



**හෝමෝ ඇන්ටිසෙසර් විශේෂයට අයත් වයස අවු. 11 පමණ ළමයෙකුගේ පොසිලයක් ඇසුරෙන් සම්පූර්ණ කල හිස්කබලක්**



**පොසිල සාක්ෂි ඇසුරින් නිර්මිත හෝමෝ ඇන්ටිසෙසර් මානව රුවක්**

විශේෂයෙන් යැයි විද්‍යාඥයෝ බොහොමයක් විශ්වාස කරති. ඒ අනුව හෝමෝ ඇන්ටිසෙසර් මඟින් එක්පසෙකින් හෝමෝ හෙයිඩල්බජෙන්සිස් හරහා නියැන්ඩර්තාල් මානවයා පරිණාමය වී ඇති අතර, තවත් පසෙකින් අප මෙතෙක් නිවැරැදිව නොදන්නා උප මානව විශේෂයක් හරහා හෝමෝ සේපියන් බිහිව ඇත. එම අදහසට අනුව නියැන්ඩර්තාල් මෙන්ම හෝමෝ හෙයිඩල්බජෙන්සිස් යන මානව විශේෂ ද නූතන මානවයා පරිණාමය වීමේ පියවරයන්ගෙන් ඉවතට බෙදී වෙන්ව ගොස් අතරමගදී අභාවයට ගිය අනු ශාඛාවකි.

එහෙත්, තවත් සමහරක් විද්‍යාඥයන් පවසන්නේ හෝමෝ ඇන්ටිසෙසර් යනු නියැන්ඩර්තාල් සහ සේපියන් මානව වර්ග දෙකක් ලෙස වෙන්ව පරිණාමය වීම ඇරඹීමටත් පෙර අනු ශාඛාවක් ලෙස වෙන්ව පරිණාමය වූ මානව විශේෂයක් බවයි. එම අදහසට අනුව සැලකූ විට අපගේ මුතුන්මිත්තකු ලෙස හෝමෝ ඇන්ටිසෙසර් සැලැකිය නොහැකි අතර, ඔවුන් අපගේ මුතුන්මිත්තන්ගේ සමීපතම නෑයන්, අසල්වැසියන් ලෙස ජීවත්ව ඇත. ඇන්ටිසෙසර් පොසිල ලෙස මෙතෙක් හමුවී ඇති පොසිල අතුරින් බහුතරයක් වැඩිහිටියන්ට අයත් පොසිල නොවීම නිසා, වැඩුණු හෝමෝ ඇන්ටිසෙසර් මානවයකුගේ හැඩරුව නිවැරැදිවම පුරෝකථනය කළ නොහැකි වීම මඟින් ඉහත ගැටලුව නිර්මාණය වී ඇත.

කෙසේ නමුත්, බහුතර විද්‍යාඥයන්ගේ අදහසට අනුව හෝමෝ ඇන්ටිසෙසර් පරිණාමය වී ඇත්තේ හෝමෝ අර්ගාස්ටර් (අප්‍රිකානු හෝමෝ ඉරෙක්ටස්) මඟිනි. එම විශේෂයන් දෙකට අයත් දත්වල ගැළපීම් අනුව මෙය වඩාත් තහවුරු වූ මතයක් වී තිබේ. එලෙස අදින් වසර ලක්ෂ 12කට පමණ පෙර හෝමෝ ඇන්ටිසෙසර් බිහිව ඇතැයි සැලැකෙන අතර, වසර 7,70,000කට පමණ පෙර මිහිමතින් වඳව ගොස් ඇත. බටහිර සහ මධ්‍යම යුරෝපයෙන් හමුව ඇති පැරැණිතම මානව පොසිල අයත් වන්නේ මෙම විශේෂයට බැවින්, එම ප්‍රදේශ මුල්ම වරට ජනාවාසකරණය කරන ලද්දේ ද මෙම මානව විශේෂය විසින් යැයි සැලැකේ. 2014දී වසර මිලියන 1.2ත් ලක්ෂ 8ත් අතර කාලයක් පැරැණි මානව පා සලකුණු එංගලන්තයේ Happisburgh නම් ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද අතර ඒවා ද අයත් වන්නේ හෝමෝ ඇන්ටිසෙසර් විශේෂයට යැයි සැලැකේ. ඒ අනුව එම කාලය වන විටත් මෙම මානව විශේෂය එංගලන්තය ජනාවාසකරණය කර ඇත.

ඇන්ටිසෙසර් මානවයන්ගේ හිස්කබල, දත්, හකු ආදිය නූතන මානවයාගේ සහ ආදි හෝමෝ මානව විශේෂයන්ගේ අතරමැදි ලක්ෂණ පෙන්නුම් කරයි. මුහුණේ හැඩය, නාසය ආදිය වත්මන් මානවයාට සමාන වුව ද, සාපේක්ෂව පටු නළලක් සතු වීම පැරැණි මානව විශේෂයන්ගේ ලක්ෂණ




**හෝමෝ ඇන්ටිසෙසර් මානවයා විසින් භාවිතා කරන ලද ගල් ආයුධ.**

පෙන්වන්නක් විය. මෙම විශේෂයට අයත් වැඩුණු මානවයකුගේ කපාල ධාරිතාව ඝන සෙ.මී. 1,000ක් පමණ වන්නට ඇතැයි ගණන් බලා ඇත. අඩි 5යි අඟල් 4ත් අඩි 6යි අඟල් 2ත් අතර සාමාන්‍ය උසක් මෙම මානව




**මානව පරිණාමය තුල හෝමෝ ඇන්ටිසෙසර් ස්ථානගතවීම.**

විශේෂයට පවතින්නට ඇතැයි විශ්වාස කෙරේ. එමෙන්ම ඇන්ටිසෙසර් මානවයන්ගේ උරහිස, පහසුවෙන් ගල් මුල් විසි කළ හැකි ආකාරයට නූතන මානවයන්ට වඩාත් සමීප ලෙස සැකැසී තිබී ඇත. එහෙත්, එලෙස සැකැසීම මඟින් පූර්ව වානර සහ මානව විශේෂ සිදු කළාක් මෙන් පහසුවෙන් ගස් නැග

# ගවේෂණ

08 වන කොටස

"මේ හැකියාව අඩුව ගොස් තිබිණි. මෙම මානවයන්ගේ දණහිස් අස්ථිය විශාලත්වයෙන් අඩු වීම නිසා වත්මන් මානවයා තරම් පහසුවෙන් පැතලි භූමි මත ඇවිදීමේ හැකියාව ඔවුන්ට නොතිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. එමෙන්ම නූතන මානවයාට වඩා පහසුවෙන් චලනය විය හැකි ලෙස, පීඩනය සහ කම්පන දරාගත හැකි ලෙස ඔවුන්ගේ වළලුකර සැකැසී තිබිණි. වර්තමාන අපට අසීරු දුව පැනීම් සිදුකිරීම සඳහා එය ඔවුනට පහසුවක් වන්නට ඇත.

හෝමෝ ඇන්ටිසෙසර් මානවයන් භාවිත කරන ලදැයි හඳුනා ගන්නා ලද ගල් ආයුධ ඊට වසර මිලියනයකට පමණ පෙර අප්‍රිකානු කලාපයේ මානවයන් භාවිත කළ ගල් ආයුධ හා සමාන වේ. ඔවුන්ගේ මුතුන්මිත්තන් අප්‍රිකානු කලාපයෙන් යුරෝපා කලාපයට සංක්‍රමණය වෙද්දී පරිසර තත්ත්වයන් වෙනස් වීම අනුව ගල් ආයුධ තාක්ෂණයේ සමහර දියුණු ලක්ෂණ මඟහැරී ගොස් නැවත මුල සිට ආරම්භ වූවා දැයි සැකයක් ද මෙම සාක්ෂි අනුව පැනනඟී. ඔවුන් නිපදවූ ආයුධ ලෙස හමු වී ඇති බොහෝ ගල් ආයුධ අක්‍රමවත් හැඩතල සහිත වේ. ඒවා බොහෝ විට ආහාර කැබලි කිරීම සඳහා යොදා ගන්නට ඇතැයි සැලැකේ.

මෙම මානවයන් ගින්දර භාවිත කරන්නට ඇති බවට සැලැකිය හැකි සාක්ෂි කිහිපයක් හමු වී ඇතත්, ආහාර පිසීම සඳහා ගින්දර භාවිත කළ බවට පිළිගත හැකි සාක්ෂි මෙතෙක් හමුව නොමැත. කෙසේ නමුත්, වසර 7,80,000ත් 9,80,000ත් අතර කාලයක් පැරණි, ක්ෂීරපායී සතකුට අයත් පිළිස්සුණු අස්ථි කොටස් 2016 වසරේ දී ස්පාඤ්ඤයෙන් හමු වී ඇත. ඒවා සෙල්සියස් අංශක 600ක තරම් ඉහළ උෂ්ණත්වයකින් පිළිස්සී ඇති අතර, එවන් උෂ්ණත්වයක් ඇති විය හැක්කේ මිනිසකු විසින් කෘත්‍රිමව නිර්මාණය කරන ලද ගිනිමැලයකින් බව විද්‍යාඥයෝ පවසති.



බටහිර යුරෝපයේ මානව ජනාවාසකරණය පිළිබඳ පැරණිතම සාක්ෂි සහිත ස්පාඤ්ඤයේ ග්‍රෑන් ඩොලිනා ගුහාව.

ඒ අනුව ඒ සමකාලීනව අදාළ ප්‍රදේශයේ වාසය කර ඇත්තේ, හෝමෝ ඇන්ටිසෙසර් මානවයන් වන බැවින්, ඔවුන් මාංශ පුළුස්සා අනුභව කරන්නට ඇති බවට තවමත් තහවුරු නොකරන ලද සැකයක් පවතී. අධික ලෙස ප්‍රෝටීන් සහිත ආහාර අනුභවයට පුරුදු වීම නිසා ශීත දේශගුණයට මුහුණ දිය හැකි වීමත්, එම අවධියේදී වර්තමානයේ තරම් ශීත කාලගුණයක් නොතිබීමත් නිසා ශීත තත්ත්වයෙන් මිදීම සඳහා ඔවුනට ගින්දර අත්‍යවශ්‍ය නොවන්නට ඇත.

පයින්, ඇල්ඩර්, බර්ච් ශාක සහිත භූමි පවතින ප්‍රදේශවල හෝමෝ ඇන්ටිසෙසර් වාසය කළ බවට සාක්ෂි ඇත. එම අවධියේ සිටි මුවන්, වල් ඌරන්, වලසුන්, වඳුරන්, මැමත් මෙන්ම රයිනෝසිරස් සතුන් මස් පිණිස මැරීම සිදු කරන්නට ඇතැයි සැක කෙරේ. එයින් ද වැඩි වශයෙන් මස් පිණිස මරා දමා ඇත්තේ මුවන් බව මෙතෙක් ලැබී ඇති සාක්ෂි අනුව සැලැකිය හැකි ය. මෙම මානවයන් කණ්ඩායම් ලෙස දඩයමේ ගොස් ඇති අතර, ඒ අතරතුර සමහරෙක් සතුන්ගේ ගොදුරු බවට පත්ව ඇති බවට ද සාක්ෂි ලැබී ඇත. මාංශ වර්ගවලට අමතරව ඔලිව්, හේසල්නට්, චෙස්නට් ආදිය ද ඇන්ටිසෙසර් අනුභව කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. එමෙන්ම ඔවුන් මිනී මස් ආහාරයට ගන්නට ඇති බව ද, ඒ වෙනුවෙන් අසල්වැසි ගෝත්‍ර දඩයම් කරන්නට ඇති බව ද විද්‍යාඥයෝ සැක පහළ කරති.




එංගලන්තයේ ඒච්චසිඉමරටය ප්‍රදේශයෙන් හමුවී ඇති හෝමෝ ඇන්ටිසෙසර් මානවයාට අයත් යැයි සැලකෙන පා සටහන්.

හෝමෝ ඇන්ටිසෙසර් මානවයා හා සමකාලීනව හෝමෝ ඉරෙක්ටස්, පැරෑන්ත්‍රොපස් රොබස්ටස් යන විශේෂ ද මිහිමත වාසය කර ඇත. ඔවුන් එකිනෙකාගෙන් වෙන්ව, වෙනස් මාවත්වල පරිණාමය වෙමින් පැවතිණි.

තවත් කොටසක් මීළඟ කලාපයට...

06 පිටුවට

# ලෝක සරණාගතභාවය පිළිබඳ හඳුනාගැනීමක්



**ලොව බොහෝ දෙනකුට විවිධ හේතු මත තමන් ඉපදී, හැදී වැඩුණු ස්ථානය හැර දමා යාමට සිදු වේ. බොහෝ විට එය කැමැත්තෙන් සිදුවන්නක් නොවේ. ඒ, වැඩි යටිතල පහසුකම් වෙනුවෙන්, අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් හෝ ආර්ථික ජීවිතයට අදාළ කරුණු හේතුවෙන් විය හැකිය; නැතහොත් සිවිල් යුද්ධමය තත්ත්වයක් නිසා හෝ ස්වාභාවික ආපදා තත්ත්වයක් නිසා හෝ වෙනත් ස්ථානයක පදිංචියට යාම සඳහා විය හැකිය. එහෙත්, ඇතැමුන්ට මෙම හේතු මත ම උපන් ප්‍රදේශය පමණක් නොව උපන් රට ද අතහැර යාමේ අසීරු තීන්දුවක් ගැනීමට සිදු විය හැකිය. රට හැර යන්නවුන්ගෙන් සැලකිය යුතු පිරිසකට තම රටේ යුද්ධමය තත්ත්වයන් හේතුවෙන් ද වධහිංසාවලින් හෝ මානව හිමිකම් උල්ලංඝනය වීම්වලින් හෝ බේරීම සඳහා ද රට හැර යාමට බල කෙරී ඇත.**

මෙසේ කවරාකාරයක හෝ වඩා යහපත් ජීවිතයක් අපේක්ෂාවෙන් යුතු පිරිස් නීති විරෝධීව රටින් බැහැර වීම සඳහා භාවිත කරන මුහුදු හෝ ගොඩබිම් ගමන අතිශය භයානක විය හැකිය. ඔවුහු රටින් බැහැරවීම සඳහා මුදල් ගන්නා මිනිස් ජාවාරම්කරුවන්ගේ රැවටීම්වලට ලක්වීමේ සිට පය තබන රටේදී අත්අඩංගුවට පත්ව දඬුවම් ලැබීම දක්වා අවදානමකට පාත්‍ර වෙති. යම් හෙයකින් රැඳී සිටීම සඳහා අවසර ලදහොත් වර්ගවාදී, විදේශික විරෝධී හිංසාවලට සහ අසාධාරණකම්වලට දෛනිකව ලක්වීමේ අවදානමක් ද තිබේ. තමන්ගේ ප්‍රජාවෙන්, ඥාතීන්ගෙන් හා මිතුරන්ගෙන් වෙන්වීම නිසා ඇතිවන හුදෙකලාව පිළිබඳ මානසික තත්ත්වයන් ද මෙවැනි පුද්ගලයකුට අහිතකර ලෙස බලපායි.

සරණාගතභාවය පිළිබඳ සාකච්ඡාවක දී ජාත්‍යන්තර වශයෙන් භාවිත වන අනිවාර්ය වචන තුනක තේරුම් නිශ්චිත කර ගැනීම අවශ්‍ය වේ. පළමුවැන්න 'සරණාගතයා' (refugee) යන්නය. දෙවැන්න 'සරණාගතභාවය ඉල්ලුම්කරන්නා' (asylum seeker) යන්නය. තෙවැන්න 'සංක්‍රමණිකයා' (migrant) යන්නය.

**සරණාගතයා :-** තම රට තුළ සිටීමෙන් වධහිංසා සිදුවීමේ හෝ බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීමේ අවදානමක් හේතුවෙන් හෝ තම රටින් පලා ගොස් ඇති පුද්ගලයායි. තමන්ගේ ආරක්ෂාවට සහ ජීවිතයට ඇති තර්ජනය දැඩිවීම හේතුවෙන් තමන්ගේ රටින් පිටවීමට ඔහුට හෝ ඇයට සිදු වී ඇති අතර, තමන්ගේ රටේ ආණ්ඩුවෙන් එම අනතුරුදායක තත්ත්වය සම්බන්ධයෙන් ආරක්ෂාවක් බලාපොරොත්තු වීමට නොහැකි වී තිබිය යුතුය. සරණාගත තත්ත්වය ලැබූ පුද්ගලයකුට ජාත්‍යන්තර ආරක්ෂාව ලැබීමේ අයිතියක් තිබේ.

**සරණාගතභාවය ඉල්ලුම්කරන්නා :-** තම රට තුළ සිටීමෙන් වධහිංසා සිදුවීමේ හෝ බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීමේ අවදානමක් හේතුවෙන් හෝ තම රටින් පලා ගොස් වෙනත් රටක සිටින නමුත්, තමන්ගේ සරණාගතභාවය ඉල්ලීමට අදාළව තීන්දුව ලැබී නොමැති, එම තත්ත්වය අපේක්ෂාවෙන් සිටින පුද්ගලයාය. සරණාගතභාවය ඉල්ලා සිටීම මානව අයිතියකි. එනම්, ඕනෑම අයකුට සරණාගතභාවය ඉල්ලා සිටීම වෙනුවෙන් තවත් රටකට ඇතුළුවීමට ඉඩ ලැබිය යුතු බව පිළිගැනේ.

**සංක්‍රමණිකයා :-** සංක්‍රමණිකයා හැඳින්වීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් නෛතික නිර්වචනයක් නැත. නමුත්, බොහෝ සහන සේවා සංවිධාන විසින් පිළිගනු ලබන්නේ සංක්‍රමණිකයා යනු තමන් උපත ලැබූ රටට පිටස්තර රටක ජීවත් වන පුද්ගලයා ලෙසය. ඔහු සරණාගතයෙක් හෝ සරණාගතභාවය ඉල්ලුම්කරන්නෙක් නොවිය හැකිය. ඇතැම් සංක්‍රමණිකයන් රැකියා වෙනුවෙන්, අධ්‍යාපන කටයුතු වෙනුවෙන් හෝ තම පවුලේ සාමාජිකයන් සමඟ එකතුවීම වෙනුවෙන් තමන්ගේ රටින් බැහැර විය හැකිය. තවත් සංක්‍රමණිකයන් තමන්ගේ රටේ දරිද්‍රතාව, දේශපාලන අස්ථාවරත්වය, සන්නද්ධ කල්ලිවල ප්‍රචණ්ඩ ක්‍රියා, ස්වාභාවික ව්‍යසන වැනි තත්ත්වයන් හේතුවෙන් තවත් රටකට යා යුතු යැයි තීරණය කළවුන්ය. ඔවුන්ගෙන් බොහෝ දෙනකු නෛතික නිර්වචනයට අදාළ සරණාගතභාවය සම්පූර්ණ කර නොමැති වුව ද, ආපසු තමන්ගේ මවුරටවලට යාමේ අවදානමක් සහිත පුද්ගලයන්ය. එබැවින්, ඔවුන්ගේ සංක්‍රමණය නීත්‍යානුකූල නොවුව ද, ඔවුන් දැනට සිටින රටේ ඔවුන්ගේ තත්ත්වය (සරණාගතභාවය ලැබීම හෝ නොලැබීම) කුමක් වුව ද, ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා විය යුතු බවට අපේක්ෂා කෙරේ. එසේම ඔවුන්ට දඬුවම් කරනු ලැබීමට හෝ යුක්තිසහගත හේතුවකින් තොරව ආපසු ඔවුන්ගේ රටවලට පිටුවහල් කිරීමට ලක් නොවිය යුතු බව සැලකේ.

මේ වන විට ලෝකයේ සරණාගතයන් මිලියන 35ක් පමණ සිටින බවට ගණන් බලා තිබේ. ඔවුන් වෙනුවෙන් සහන සේවා සහ ආරක්ෂාව ලබාදීමට විවිධ රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ නිල ආයතනික ව්‍යුහයන් ද්විත්වයක් ද ක්‍රියාත්මකය.

### UNHCR

සරණාගතයන් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ සංවිධාන දෙකෙන් එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (UNHCR) පළමුවැන්නය. 1950 වසරේ පිහිටුවන ලද එම සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හෝ ආණ්ඩුවක ඉල්ලීම මත සරණාගතයන්ට ආධාර කිරීමට සහ ආරක්ෂාව සැලසීමට ඉදිරිපත් වෙයි. එසේම කල්පවත්නා විසඳුම් ලෙස සරණාගතයන්ට තමන්ගේ මවුරටට ආපසු පැමිණීමට හා නැවත පදිංචි කරවීමට අදාළ කටයුතුවලට ද මෙම සංවිධානය මැදිහත් වේ. මෙම සංවිධානය පලස්තීන සරණාගතයන් හැරෙන්නට ලෝකයේ ඕනෑම රටක සරණාගතයින් සම්බන්ධව කටයුතු කරයි.

### UNRWA

1947-1949 කාලයේ ඊශ්‍රායල ආක්‍රමණ හේතුවෙන් අවතැන්වූ පලස්තීන ජාතිකයන් වෙනුවෙන් කටයුතු කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව වෙනම ආයතනයක් - එක්සත් ජාතීන්ගේ සහන සහ කාර්ය ඒජන්සිය (UNRWA) - ස්ථාපනය කරනු ලැබ තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය 'පලස්තීන සරණාගතයා' යන්න නිර්වචනය කරනු ලබන්නේ "1946 ජූනි 01 සිට 1948 මැයි 15 දක්වා කාලය තුළ තමන්ගේ සාමාන්‍ය වාසස්ථානය පලස්තීනය කරගත්තා වූ ද, 1948 යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස නිවස සහ ජීවිකාව අහිමිවූ ද පුද්ගලයන්" ලෙසය. ආරම්භයේ 7,00,000ක් පමණ වූ මෙම පිරිස පදනම් කරගනිමින් වසර 70ක කාලය තුළ මිලියන 5ක් දක්වා වර්ධනයවූ පලස්තීන සරණාගත අර්බුදය කළමනාකරණය කරනු ලබන්නේ මෙම සංවිධානයයි. ඊශ්‍රායලයට පහර දීමට පලස්තීන සටන්කාමීන්ට සහාය දැක්වූ බව කියමින් පසුගියදා ඊශ්‍රායලය විසින් චෝදනා එල්ල කරනු ලැබුවේ ගාසාහි සහන සේවාවන්හි නිරතව සිටි මෙම සංවිධානයේ කාර්යමණ්ඩලයටය.

## රාජ්‍ය ආයතන විකිණීම.......

02 -03 පිටුවෙන්

| | | | | |
|---|---|---|---|---|
| 05. | ජාතික රක්ෂණ සංස්ථාව | 2002 ජුනි | | 737.5 |
| 06. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2003 ජුනි | | 6,050.0 |
| 07. | එන්.ඩී.බී. බැංකුව | 1993 අගෝස්තු | 7.2 | 32.7 |
| 08. | සී.ස. ලංකා වාණිජ බැංකුව | | | |

| | වෙනත් ආයතන | වසර සහ මාසය | ප්‍රතිශතය | මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 01. | යුනයිටඩ් මෝටර්ස් | 1989 දෙසැම්බර් | - | 95.0 |
| 02. | හුන්නස් ෆෝල්ස් හෝටලය | 1991 අගෝස්තු | - | 18.0 |
| 03. | ඒෂියන්ස් හොටෙල් | 1992 ජනවාරි | 91% | 953.6 |
| 04. | සතොස මෝටර්ස් | 1992 අගෝස්තු | - | 24.8 |
| 05. | සතොස කම්පියුටර් සර්විස් | 1992 නොවැම්බර් | - | 1.5 |
| 06. | සිලෝන් ෂිපින් ලයින්ස් | 1992 දෙසැම්බර් | 61% | 51.3 |
| 07. | ට්‍රාන්ස් ඒෂියා හෝටලය | 1993 මැයි | 86.9% | 1,124.4 |
| 08. | ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලය | 1993 මැයි | 61% | 181.0 |
| 09. | කොළඹ ජාත්‍යනතර පාසල | 1993 නොවැම්බර් | - | 159.3 |
| 10. | ලංකා ට්‍රැක්ටර්ස් | 1994 ජනාරි | 70% | 144.5 |
| 11. | ලංකා ලුබ්‍රිකන්ට් | 1994 ජූලි | - | 1,245.1 |
| 12. | ඔරියන්ට් ලංකා | 1996 මැයි | - | 1,740.0 |
| 13. | ලංකා ටෙලිකොම් | 1997 අගෝස්තු | 50.5% | 16,636.7 |
| 14. | එයාර් ලංකා | 1998 මාර්තු | 40% | 1,979.0 |
| 15. | ලංකා මැරයින් සර්විස් | 2002 අගෝස්තු | - | 1,199.4 |
| 16. | බුහාරි හෝටලය | 2003 අප්‍රේල් | - | 7.4 |
| 17. | තාජ් ලංකා හෝටලය | 2003 සැප්තැම්බර් | 2.7% | 59.7 |
| 18. | ගලධාරි හෝටලය | 2003 සැප්තැම්බර් | 0.2% | 4.4 |
| 19. | සතොස සිල්ලර | 2003 නොවැම්බර් | 33% | 680.0 |
| 20. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2003 දෙසැම්බර් | 100% | 7,296.7 |

## ද්‍රව්‍ය පැවැත්මේ ස්වරූප.....

08 - පිටුවෙන්

මීට අමතරව අතරමැදි ස්වරූප ලෙස ද්‍රව ක්‍රිස්ටල් (Liquid Crystal) වැනි ඝන හා ද්‍රව අතරමැදි ස්වරූප (සබන්, ක්ලේ) ලෙසද පවතී. එසේම ඉහත මූලික ස්වරූපවලට අයත් වන එහෙත්, අභ්‍යන්තර ලක්ෂණ අනුව විශේෂීකරණයවූ වීදුරු, ක්‍රිස්ටල් වැනි උපවිශේෂ ස්වරූපද ද්‍රව්‍යවලට ඇත.

මෙතෙක් හඳුනාගෙන තිබූ ඉහත සඳහන් ද්‍රව්‍ය මූලික ස්වරූප පහක් වුවද, සැබැවින්ම ද්‍රව්‍ය පැවැත්මේ ආකාර අනන්ත වේ. නවීන විද්‍යාවේ සොයාගැනීම් තුළින් ඒවා මේ වන විට අනාවරණය වෙමින් තිබේ.

**විද්‍යාත්මක කරුණු මත පදනම්ව ද්‍රව්‍යයේ පැවැතිය හැකි තවත් උපකල්පිත ආකාර ගණනාවක් ගැන පුරෝකථනය කරනු ලැබ තිබේ. එහිදී ඉතා අඩු උෂ්ණත්වයක් යටතේ දැකිය හැකි ආකාර ලෙස සුපිරි තරල (Super Liquid), බෝස් - අයින්ස්ටයින් ඝනීකරණය (Bose - Einstein Condensate), ෆර්මියොනික් ඝනීකරණය (Fermionic Condensate), රයිඩ්බර්ග් අණුව (Rydberg Molecule), ක්වොන්ටම් හෝල් තත්ත්වය (Quantum Hall), ෆොටෝනිය පදාර්ථ (Photonic Matter) සහ ඩ්‍රොප්ලෙක්ටන් (Droplecton) ආදිය හඳුනාගත හැකිය. ඉහළ ශක්ති තත්ත්වයක් යටතේ පැවැතිය හැකි ද්‍රව්‍යයේ උපකල්පිත ආකාර කිහිපයක් තිබේ.**

**හායන (අඩු වෙමින් යන) පදාර්ථ (Degenerate Matter), ක්වාර්ක් පදාර්ථ (Quark Matter), වර්ණ - වීදුරු ඝනීකරණය (Colour - Glass Condensate) ආදිය මේ සඳහා නිදසුන්ය.**

**මීට අමතරව තවත් විශේෂ උපකල්පිත ආකාර ලෙස සුපිරි ඝන (Super Solid), සුපිරි වීදුරු (Super Glass), තන්තු - දැල් ද්‍රාවණ (String - Net Liquid) ආදී විශේෂද වෙයි. මෙවැනි ආකාර බොහොමයක් විශ්වයේ කොතැනක හෝ පැවැතිය හැකි යැයි නිගමනය කර තිබුණද, ස්වාභාවික ලෙස නිරීක්ෂණය කිරීමට නොහැකි නිසා ඒවා විද්‍යාගාර තුළ විශේෂ තත්ත්වයන් යටතේ නිපැදවීමට විද්‍යාඥයෝ උත්සාහ දරමින් සිටිති. ඒ අතුරින් මේ වන විට බෝස් - අයින්ස්ටයින් ඝනීකරණ තත්ත්වය නිපැදවීමට විද්‍යාඥයෝ සමත් වූහ. බෝසෝන අංශු නිරපේක්ෂ ශුන්‍ය (-237°C) ගුරුත්වය යටතේ සිසිල් කළ විට මෙම ද්‍රව්‍ය ආකාරය හඳුනාගත හැකිය. 2020 ජුනි මාසයේදී ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ පිහිටි ශීත අණුක විද්‍යාගාරයේදී මෙම නිපැදවීම කරනු ලැබ තිබේ.**

# ද්‍රව්‍ය සහ එහි පැවැත්මේ ස්වරූප

**දර්ශනවාදයේ මූලික ප්‍රශ්නයට වඩාත් නිවැරැදිව පිළිතුරු සැපයීමේ දී ද්‍රව්‍යයේ සහ විඥානයේ ස්වභාවය පිළිබඳ දැනුමක් අවශ්‍ය වේ. සියල්ලට මූලික වන්නේ ද්‍රව්‍ය බව භෞතිකවාදී දර්ශනයේ මූලික පදනමයි. එම නිසාම ද්‍රව්‍ය සහ එහි පැවැත්මේ ස්වරූප දෙස වඩාත් සමීපව බැලිය යුතුවා මෙන්ම ගැඹුරින් අධ්‍යයනය කළ යුතුයි. මෙම කෙටි ලිපිය ඒ සඳහා ප්‍රවේශයකි.**

## ද්‍රව්‍ය යනු...

අප අවට ලෝකයේ අනේකවිධ වස්තු රාශියකි. පියවි ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර අංශුවල සිට අතිවිශාල ග්‍රහලෝක, තාරකා, කළු කුහර, මන්දාකිණි දක්වාවූ අජීවී වස්තූද, සරල සෛලවල සිට (ශාක හෝ සත්ව) සංකීර්ණ සත්වයා දක්වාවූ ජීවී වස්තූද පිළිබඳ අත්දැකීම් මිනිසාට තිබේ. ඇතැම් දේ පියවි ඇසට පෙනේ. තවත් දේ නොපෙනේ. ඇතැම් දේ අපට නුහුරුය. නමුත්, ඒවායේ පැවැත්ම අපේ ඉන්ද්‍රියයන්ට දැනේ. ඇතැම් දේ අපට දුරින් පවතින අතර, ඇතැම් දේ අපට ආසන්නව පවතී. තවත් දේවල් පියවි ඇසට නොපෙනුණද, උපකරණ ආධාරයෙන් නිරීක්ෂණය කළ හැකිය.

මේ සෑම දෙයකටම විවිධවූ ජාතිලක්ෂණ, ගුණ සහ විශේෂතා තිබෙන බව අපි අත්දැකීමෙන් දනිමු. ලෝකයේ පවතින මෙම විවිධත්වය නිසා විස්මයට පත් මිනිසා මේ ආකාරයට තමා වටා ඇති සියලු වස්තුවලට පොදුවූ එකම පදනමක් නැතහොත්, සියල්ලට පොදුවූ ජාතිලක්ෂණයක් තිබේදැයි බොහෝ කලක සිට කල්පනා කරන්නට විය.

මේ ආකාරයට කාලානුරූපව එක් කර ගත් මිනිස් අත්දැකීම් සහ විද්‍යාවේ වර්ධනය විසින් අත් කර ගත් දැනුමත් ආශ්‍රයෙන් මිනිසාට ඒත්තුගන්වනු ලැබුවේ, මේ සියලු වස්තු මිනිස් විඥානයෙන් පරිබාහිරව සහ ඉන් ස්වාධීනව පවතින බවයි.

මෙලෙස මිනිස් විඥානයෙන් පරිබාහිර සහ ස්වාධීනව (වාස්තවික) යථාර්ථය තුළ පවතින දේ නම් කරනු ලබන්නේ ද්‍රව්‍ය නමැති දාර්ශනික සංකල්පයෙනි.

මාක්ස් සහ එංගල්ස් විසින් සූත්‍රගත කරන ලද දයලෙක්තික භෞතිකවාදයේ මූලධර්මවල පදනම මත සහ ස්වභාව විද්‍යාවේ නවතම සොයාගැනීම් සාමාන්‍යකරණය තුළින් ද්‍රව්‍ය දාර්ශනික ප්‍රවර්ගයක් වශයෙන් ලෙනින් නිර්වචනය කළේය.




“ද්‍රව්‍ය වූ කලී මිනිසාට තමන්ගේ සංවේදනයන් මඟින් දෙනු ලබන සහ අපේ සංවේදනයන්ගෙන් පරිබාහිරව පවතිමින්, අපේ සංවේදනයන් විසින් පිටපත් කරනු ලබන ඡායාරූපගත කරනු ලබන සහ පරාවර්තනය කරනු ලබන වාස්තවික යථාර්ථය පෙන්නුම් කරන දාර්ශනික ප්‍රවර්ගයකි.”

-ලෙනින් - 'භෞතිකවාදය හා අනුභූතිවාදී විවේචනය'.

පෘථිවිය මෙන්ම එය ඇතුළත් සෞරග්‍රහ මණ්ඩලය සහ ක්ෂීරපථ මන්දාකිණියද, තවත් එවැනි මන්දාකිණි සහ විශ්වය පුරා පැතිරී තිබෙන සමස්ත වස්තු පද්ධතිය මිනිසා බිහිවීමට පමණක් නොව පොදුවේ සියලු ජීවීන්ගේ බිහිවීමට වසර මිලියන ගණනාවකට පෙර සිට පවතින බව විද්‍යාව මඟින් මේ වන විට ස්ථිර ලෙසම සනාථ කොට තිබේ.

ද්‍රව්‍ය මෙන්ම පොදුවේ ස්වභාවධර්මය වාස්තවික බවත්, එය මිනිසාට සහ ඔහුගේ විඥානයට පරිබාහිරව සහ ස්වාධීනව පවතින බවත්, විඥානය හුදෙක් ද්‍රව්‍යමය ලෝකයේ දීර්ඝකාලීන පරිණාමයක ප්‍රතිඵලයක් බවත් මේ වන විට ඔප්පු කොට තිබේ.

වඩාත් ප්‍රාථමික (සියල්ලට මූලික) වන්නේ ද්‍රව්‍ය බවත්, ද්‍රව්‍ය මැවීමට හෝ විනාශ කිරීමට හෝ නොහැකි බවත් මෙන්ම ද්‍රව්‍ය සදාකාලික (නිරපේක්ෂ ආරම්භයක් හෝ අවසානයක් හෝ නොමැති) බවත්, සිදුවන්නේ ද්‍රව්‍ය එක් ස්වරූපයක සිට වෙනත් ස්වරූපයකට පරිවර්තනය වීම බවත් නූතන විද්‍යාව මඟින්ද සනාථ කර තිබේ.

**පුරාණ දාර්ශනිකයෝ ද්‍රව්‍ය, ආපෝ, තේජෝ, වායෝ, පඨවි (ජලය, ගින්න, වාතය, පස්) යන සීමාවලට ලඝු කොට සැලැකූහ.** පසුකාලීනව පරමාණුව සොයා ගැනීමත් සමඟ එය ද්‍රව්‍යයේ කුඩාම ඒකකය (තවදුරටත් බෙදිය නොහැකි) බවට විශ්වාස කරනු ලැබීය. පසුව පරමාණුවද සංකීර්ණ ප්‍රපංචයක් බවත්, එය ප්‍රෝටෝනවලින් සහ නියුට්‍රෝනවලින් සමන්විත න්‍යෂ්ටියකින් සහ ඒ වටා භ්‍රමණය වන ඉලෙක්ට්‍රෝනවලින් සමන්විත බවත් සොයා ගැනිණි. එපමණක් නොව ඒවාද තැනී ඇත්තේ, තවත් උප ක්ෂුද්‍ර අංශුවලින් බවත් මේ වන විට සොයාගෙන තිබේ. ලෙනින් ඒ පිළිබඳව මෙසේ පවසා තිබේ.

“දයලෙක්තික භෞතිකවාදයට අනුව ද්‍රව්‍යයේ මූලික අංශුවක් කිසිදා සොයාගත නොහැකිය. ඉලෙක්ට්‍රෝනයද පරමාණුව මෙන් නිරවශේෂ (බිඳිය නොහැකි) නොවේ. ස්වභාවධර්මය අනන්තය.

-ලෙනින් - වෙළුම 14, පිටුව ....

### ද්‍රව්‍ය පැවැත්මේ ආකාර

1. ඝන අවස්ථාව.
2. ද්‍රව අවස්ථාව.
3. වායු අවස්ථාව.
4. ප්ලාස්මා අවස්ථාව.
5. ශක්ති/ක්ෂේත්‍ර ලෙස.

07 පිටුවට



**“ද්‍රව්‍ය අතුරුදන් වීම යන්නෙන් අදහස් වන්නේ ද්‍රව්‍යයන් අප දන්නා සීමාවන් අතුරුදන්වී මිනිස් දැනුම වඩ වඩාත් ද්‍රව්‍යයන්ගේ හරය කරා ව්‍යාප්ත වීමයි. අතුරුදන්වී ඇත්තේ, මුලින් ප්‍රාථමික, පරිපූර්ණ සහ නිරපේක්ෂ යැයි සිතා සිටි ද්‍රව්‍යයන්ගේ ඇතැම් ගුණාංග මිස ද්‍රව්‍ය නොවේ.”**

ලෙනින් - එකතු කළ කෘති වෙළුම 14, පිටුව 26 (භෞතිකවාදය හා අනුභූතිවාදී විවේචනය).